**පළාත් මාර්ග ව්‍යාපෘතියේ - ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය - 2015**

පළාත් මාර්ග ව්‍යාපෘතියේ - ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය 2015 ජනවාරි 01 සිට 2015 ඔක්තෝබර් 15 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය(ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630- එල්කේ දරන ණය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

පළාත් මාර්ග ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ඌව, නැගෙනහිර හා උතුරු පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ වැඩිදියුණු කළ මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මගින් ඌව, නැගෙනහිර හා උතුරු පළාත්වල සමාජ-ආර්ථික මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 475 කට සමාන එජඩො මිලියන 3.8 ක් වන අතර, සම්පූර්ණ මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, 2015 ඔක්තෝබර් 15 දින දක්වා ව්‍යාපෘතියේ කටයුතු පවත්වා ගෙන ගොස් තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම

පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 ඔක්තෝබර් 15 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 ඔක්තෝබර් 15 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 ඔක්තෝබර් 15 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 ඔක්තෝබර් 15 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2010 ඔක්තෝබර් 10 දිනැති අංක MOFP/01/2010/01 දරන චක්‍රලේඛය අනුව දිනකට ගෙවිය හැකි අනියම් දීමනාව එජඩො 30 ක් වුවද, ව්‍යාපෘතිය විසින් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් 10 දෙනෙකු සඳහා එක් නිලධාරියෙකු වෙනුවෙන් දිනකට එජඩො 50 බැගින් වූ අනියම් දීමනා ගෙවා තිබුණි.එමනිසා, ව්‍යාපෘතිය විසින් රු.224,000 ක මුදලක් වැඩිපුර වැයකර තිබුණි.තවද, සංචාරයක් නිමවා දිවයිනට පැමිණ දින 07 ක් ඇතුළත වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද, 2015 ඔක්තෝබර් 15 දින වන විටත් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ හා 2015 ඔක්තෝම්බර් 15 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ, වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 ඔක්තෝම්බර් 15 දින දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංසං | 3.80 | 475 | 46 | 0.25 | 33.30 | 2.65 | 332.04 |
| ශ්‍රීලංර | - | - | - | - | 8.20 | - | 9.53 |
| එකතුව | 3.80 | 475 | 46 | 0.25 | 41.50 | 2.65 | 341.57 |

ඉහත තොරතුරු අනුව, රු.මිලියන 475 කට සමාන එජඩො මිලියන 3.8 ක්වූ ණය ගිවිසුමේ මුළු වෙන්කිරීමෙන් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේ රු.මිලියන 334.2 කට සමාන එජඩො මිලියන 2.65 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**3.2** **භෞතික ප්‍රගතිය**

ණය සපයනු ලබන නියෝජිතායතනය සමග ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධිත ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සම්බන්ධීකරණය කිරීමේ වගකීම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය විසින් දරනු ලැබේ. එමනිසා, ඉදිකිරීම් 6 ක ප්‍රසම්පාදන, උපදේශන අධීක්ෂණය සහ තාක්ෂණික සහාය වැනි ආධාරක සේවා සහ ඒ පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සමග සම්බන්ධ වී සමාජ හා පාරිසරික කටයුතු ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය විසින් නිම කර තිබුණි.

**3.3** **මතභේදයට තුඩුදෙන කරුණු**

2015 මාර්තු අවසානයේදී චීනයේ අධ්‍යයන චාරිකාවකට සහභාගි වී තිබූ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් පිරිසක් වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් පාඨමාලා ගාස්තු,සංයුක්ත දීමනා සහ ගුවන් ගමන් දීමනා ආදිය සඳහා රු.මිලියන 12.95 ක් වැය කර තිබුණි.දේශීය නියෝජිතයෙක් හරහා තායිලන්ත ආයතනයක් විසින් එම සංචාරය සංවිධානය කරන බව දක්වා ඇති නමුත්, උක්ත ආයතනය සමග සම්බන්ධතාවයක් නොමැති බව සහ දේශීය නියෝජිතයෙකු පත්කර නොමැති බව අදාළ ආයතනය විසින් විගණන නිළධාරීන් වෙත ඍජුවම දැනුම් දෙන ලදී. ලබා ගත හැකි වූ තොරතුරු අනුව, දේශීය නියෝජිතයා ලෙස ආයතනය සමග සම්බන්ධතාවය තහවුරු කිරීම සඳහා ව්‍යාපෘතිය වෙත වංචනික ලියකියවිලි ඉදිරිපත් කරන ලද පුද්ගලයෙකුට පාඨමාලා ගාස්තුව ලෙස රු.මිලියන 6.73 ක මුදලක් 2015 ජනවාරි 31 සහ 2015 මාර්තු 31 ගෙවා තිබුණි.

**3.4** **මූල්‍ය පාලනයේ ගැටලු**

ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට දෙනු ලබන මුදල් අත්තිකාරම් සම්බන්ධ මූල්‍ය පාලනය ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය මගින් සෑහීමකට පත්විය හැකි අයුරින් ක්‍රියාත්මක කරනු නොලැබේ.මුදල් රෙගුලාසි 371(අ) අනුව අදාළ කාර්යය නිම වූ වහාම අත්තිකාරම පියවිය යුතු වුවද නිළධාරීන් තිදෙනෙකු විසින් අවස්ථා 17 ක දී ලබා ගත් රු.460,000 ක් වූ මුදල් අත්තිකාරම පියවීමට දින 22 සිට දින 188 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.එයින් රු.10,000 ක හා රු.40,000 ක සම්පූර්ණ අත්තිකාරම් මුදලම අදාළ කාර්යයන් සඳහා උපයෝජනය නොකර පිළිවෙළින් දින 12 ක හා දින 61 ක කාල ප්‍රමාදයකින් යුතුව පියවා තිබුණි.

**3.5** **ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම**

ව්‍යාපෘතියේ කටයුතු 2015 ඔක්තෝබර් 15 දින අවසන් වී ඇති අතර රු.මිලියන 25.96 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර ඇති වත්කම් පළාත් මාර්ග අධිකාරීන් වෙත වරින්වර භාර දීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි.කෙසේ වුවද, අදාළ නියෝජිතායතන විසින් වත්කම් පවරා ගත් බව තහවුරු කිරීමට කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.තවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ඇවර කිරීමට කටයුතු කර නොතිබුණි.